හිතවත් පාරිභෝගික මහතාණෙනි/මහත්මියනි,

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පාරිභෝගික ප්‍රඥප්තිය යටතේ සදහන් කර ඇති අවශ්‍යතාවයකට අනුව, අප විසින් පිරිනමනු ලබන්නාවූ, ඔබට අවශ්‍යවන සහ ඔබට සුදුසු බැංකු සැලසුම්/සේවාවන් තෝරා ගැනීමේදී ඔබට සහය වීම අරමුණු කොටගෙන ප්‍රධාන කරුණු අඩංගු ලේඛන [KFD] මාලාවක් අප විසින් සකස් කර ඇත.

මෙම ප්‍රධාන කරුණු අඩංගු ලේඛන [KFD] මඟින් ඔබට විවිධාකාරයේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් සහ ගිණුම් ආශ්‍රිත විශේෂ පැකේජ පිළිබඳව සහ පුද්ගලික බැංකුකරණය සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙහි පුද්ගලික විදේශ මුදල් ගිණුම් පිළිබඳව පුළුල් අවබෝධයක් ඔබට ලබා දෙනු ඇත.

කෙසේ වෙතත්, පහත සදහන් KFD හි දක්වා ඇති කරුණු, නීතියෙහි සහ නියාමනයෙහි සිදුවන වෙනස්කම් සහ බැංකුවේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල සිදුවන වෙනස්කම් අනුව සංශෝධනයට ලක්විය හැකි බව කරුණාවෙන් සලකන්න. බැංකුවේ එවැනි ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල සිදුවන වෙනස්කම් සම්බන්ධයෙන් KFD හි කෙරෙන ඕනෑම සංශෝධනයක් පිළිබඳව බැංකුව විසින් ඔබ දැනුවත් කරනු ලබන බව සලකන්න.

ඔබට වැඩිදුර තොරතුරු දැන ගැනීමට අවශ්‍ය නම් කරුණාකර පහත සදහන් ආකාරයට www.nationstrust.com ඔස්සේ හෝ පැය 24 පුරා ක්‍රියාත්මක ඇමතුම් මධ්‍යස්ථානයේ දුරකථන අංක 011 4 711 411 හරහා අප හා සම්බන්ධ වන්න.

පහත සපයා ඇති ඔබගේ කිසියම් ගිණුමක් සම්බන්ධයෙන් ඔබට කුමන හෝ පැමිණිල්ලක් ඇත්නම් කරුණාකර **පැමිණිලි නිරාකරණය කිරීමේ නිලධාරි, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී, අංක 242, යුනියන් පෙදෙස, කොළඹ 2** යන ලිපිනයට පැමිණිල්ලේ දැන්වීම ඇතුළත් කෙටි ලිඛිත ප්‍රකාශයක් අප වෙත යොමු කරන්න. නැතහොත් දුරකථන: [**+94(0)114711411**] / [customerservice@nationstrust.com] යන විද්‍යුත් තැපෑලෙන් අප හා සම්බන්ධ වන්න. අපි ඉක්මනින් ඔබට ප්‍රතිචාර දක්වන්නෙමු.

ගිණුම පිළිබඳ විස්තර	පාරිභෝගිකයින්ට ලැබෙන ප්‍රතිලාභ	ගාස්තු වර්ග සහ අනෙකුත් බැංකු ගාස්තු	ගිණුමක් විවෘත කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය	ප්‍රධාන නියමයන් සහ කොන්දේසි
විශේෂ ගිණුම්				
නේෂන්ස් ළමා ආයෝජන සැලැස්ම මෙය අවම වශයෙන් වසර 2 ක සහ උපරිම වශයෙන් වසර 18 ("ඉලක්ක කාලය") ක එකඟ වූ කාල සීමාවක් අවසානයේ පාරිභෝගිකයෙකුට තම දරුවා වෙනුවෙන් ඉලක්කගත මුදල් ප්‍රමාණයක් ලගාකර ගැනීම සඳහා සෑම මසකම ස්ථාවරව ඉතිරිකිරීම සඳහා යම් මුදලක් ("ස්ථාවර මාසික වාරිකය") වෙන් කිරීමට හැකි වන පරිදි නිර්මාණය කර ඇති සැලසුමකි.	ඉලක්කගත කාල සීමාව පුරාවට සහතික කාල පොලී අනුපාතය. මෙම ගිණුම විවෘත කර ඇත්තේ කුමන දරුවාගේ ප්‍රතිලාභය සඳහාද ඒ දරුවාගේ දෙමාපියන්ට හෝ නීත්‍යානුකූල භාරකරුට(වන්ට) උපරිමය රුපියල් මිලියන 2ක් දක්වා නොමිලේ ජීවිත ආවරණයක්.	ගිණුමක් නිසි කාලය එළඹීමට පෙර වසා දමන අවස්ථාවේදී පහත සඳහන් පොලී අනුපාතය පරිදි දඩ ගාස්තුවක් අය කෙරේ: වසර 2ක් වනවිට හෝ ඊට පෙර ආයෝජන සැලසුම අත්හිටවනු ලැබුවහොත් - නේෂන්ස් සේවර් පොලී අනුපාතයට අදාළ වන අනුපාතය වසර 2 පසුව ආයෝජන සැලසුම අත්හිටවනු ලැබුවහොත් - නේෂන්ස් සේවර් පොලී අනුපාතයට අදාළ වන අනුපාතය සහ +1% ක්	පහත සඳහන් ලේඛන සමග නේෂන්ස් කිඩ්ස් ආයෝජන සැලැසුම් ගිණුමක් විවෘත කිරීමේ පෝරම සම්පූර්ණ කළ යුතුය: • දරුවාගේ උප්පැන්න සහතිකයේ පිටපතක් • දෙමාපියන්ගේ / භාරකරුගේ ජාතික හැඳුනුම්පතෙහි (NIC) / වලංගු විදේශ ගමන් බලපත්‍රයෙහි පිටපතක් • ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රයේ සඳහන් නේවාසික ලිපිනය වෙනස් නම් ලිපිනය තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි අවශ්‍ය වේ.	දෙමාපියකු හෝ භාරකරුවෙකු විසින් දරුවා වෙනුවෙන් ගිණුම විවෘත කළ යුතුය. අවම ශේෂයක් පිළිබඳ අවශ්‍යතාවයක් නොමැත. කෙසේ වෙතත්, පාරිභෝගිකයාට සම්පූර්ණ ඉලක්කගත මුදල සාක්ෂාත් කර ගැනීමට හැකි වන පරිදි ස්ථාවර මාසික වාරිකය අඛණ්ඩව තැන්පත් කළ යුතුය. ගිණුම් හිමියාගේ අභාවයේ දී, බාලවයස්කරුගේ නම යටතේ කිඩ්ස් ඉතුරුම් ගිණුමට අරමුදල් මාරු කරනු ලැබේ.. පාරිභෝගිකයාගේ අභිමතය පරිදි බැංකුව විසින් ලබා දී ඇති කලින් තීරණය කරන ලද ආයෝජන සැලැස්මේ ගෙවීම් කාලසටහනෙන් ඉලක්කගත මුදල තීරණය කළ හැකි නමුත් තැන්පත් කරනු ලබන මාසික වාරිකය එසේ තීරණය කළ නොහැක. ඉලක්කගත මුදල අදාළ වන අවස්ථාවන් වලදී රජයේ බදුවලට යටත් වේ. නේෂන්ස් කිඩ්ස් ආයෝජන සැලැස්ම යටතේ සහ පුද්ගලික ආයෝජන සැලසුම් ගිණුම යටතේ පාරිභෝගිකයාට රක්ෂණ ආවරණයක් නිකුත් කර ඇත්නම්, පාරිභෝගිකයාගේ අභාවයේදී ගෙවිය යුතු උපරිම රක්ෂිත මුදල වන්නේ රුපියල් 2,000,000 කි.

- මෙහි අඩංගු නිශ්චිත නියමයන් සහ කොන්දේසි වලට අමතරව, සියලුම සාමාන්ය නියමයන් සහ කොන්දේසි නේෂන්ස් ළමා ආයෝජන සැලැස්ම
- සැලැස්මට අදාළ වන අතර පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටීන් පොදු ව්‍යාපාර කොන්දේසි https://www.nationstrust.com/images/pdf/general-business-conditions.pdf හි දක්වා ඇත.
- කලින් කලට සංශෝධනයට ලක් විය හැකි ගාස්තු වර්ග සහ අනෙකුත් බැංකු ගාස්තු බැංකුවේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.
- මෙම ලේඛනයේ ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ පිටපත් අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට, මෙහි ඉංග්‍රීසි භාෂා පාඨය බලපැවැත්විය යුතුය